දිනමිණ

■ වර්ෂ 2018 ක්‍රි

# උද්ධමනයේ පහළම අගය ඔක්තෝබර්වල වාර්තා වෙලා

මහින්ද අලුත්ගෙදර

වේගවත් ආර්ථික වර්ධනයක් කරා ගමන් කරන ශ්‍රී ලංකාවේ උද්ධමනය පසුගිය 2016 වසරේ ජනවාරි මාසයේ සිට වාර්තා වූ පහළම අගය පසුගිය ඔක්තෝබර් මාසයේ දී වාර්තා කිරීමට සමත්ව තිබේ.

ඒ අනුව පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය මෙලෙස සියයට 0.1 දක්වා පහළ අගයක් කරා ගමන්කර තිබෙන අතර තෙවැනි වරටත් එම අගය පසුගිය ඔක්තෝබර් මාසයේ දී වාර්තා වී තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වාදෙයි.

ඉහළ ආහාර මිල ගණන් හේතුවෙන් පසුගිය වසරේ අනුරූප මාසයේ දී පැවැති ඉහළ පදනම් අගය 2018 ඔක්තෝබර් මාසයේ දී දක්නට ලැබුණු මතුපිට උද්ධමනයෙහි පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය තෙවන වරටත් අඛණ්ඩව පහළ ගිය අතර 2018 ඔක්තෝබර් මාසයේ දී එය සියයට -6.6 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය අඛණ්ඩව ඉහළ ගිය අතර 2018 ඔක්තෝබර් මාසයේ දී එය සියයට 5.8 ක් ලෙස වාර්තා විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස 2018 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 4.0 සිට 2018 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.3 දක්වා පහළ ගියේය.

ආහාර නොවන කාණ්ඩය තුළ, විශේෂයෙන් ප්‍රවාහන (පෙට්‍රල්, ඩීසල්, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු) සහ විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩවල මිල ඉහළ යෑම් හේතුවෙන් 2018 ඔක්තෝබර් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස්වීම සියයට 0.4 කින් ඉහළ ගියේය. මේ අතර ආහාර නොවන කාණ්ඩයෙහි මිල ගණන් 2018 ඔක්තෝබර් මාසය තුළ පහළ ගිය අතර මාළු, බිත්තර සහ පොල් යන අයිතමවල සැලකිය යුතු මිල පහළ ගිය බව ද ශ්‍රී ලංකා මහ බැංකුව සඳහන් කරයි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි දර්ශකයෙහි මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2018 සැප්තැම්බර් මාසයේ දී පැවැති සියයට 3.1 හි සිට 2018 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.4 දක්වා ඉහළ ගිය අතර වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2018 ඔක්තෝබර් මාසයේ දී සියයට 2.4 හි නොවෙනස්ව පැවතුණි.